**මොරටුව විශ්වවිද්‍යාලය - 2016**
**-----------------------------------**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2017 සැප්තැම්බර් 29 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,397,553,848 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 86 ඡේදයේ (ඉ) ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් සැසඳීමක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

---

වෙනත් ලැබීම් රු.23,497,499 ක් සහ පර්යේෂණ සම්මන්ත්‍රණයේ ශුද්ධ ලැබීම් රු.13,462,742 ක් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ මුදල් ගලා ඒමක් ලෙස සාවද්‍ය ලෙස ඇතුළත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුලනය කර තිබූ අතර එම ආදායම්වලට අදාළ විස්තරාත්මක උපලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රදාන ලෙස රු. 1,353,500,000 ක් ලැබී තිබුණද පෙර වර්ෂය අවසානයේදී වූ ලැබිය යුතු ප්‍රදාන ලෙස රු. 66,947,711 ක් අඩු කර ඉතිරි රු.1,286,552,289 ක මුදල සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රේෂණ ඉක්මවා දරන ලද වියදම් රු. 77,406,825 ක් සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාරයෙන් ලැබියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙනයනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා, ව්‍යාපෘති, පුහුණු වැඩසටහන් හා වෙනත් වැඩසටහන් සම්බන්ධ අරමුදල් ගිණුම්, අක්‍රීයව පවතින්නේනම් විශ්වවිද්‍යාලයේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශය හා පාලක සභාවේ අනුමැතියෙන් පියවා දැමීම කළයුතු වුවද වර්ෂ 03 ක සිට අක්‍රීයව පවතින අරමුදල් ගිණුම් 03 ක අවසාන බැර ශේෂයන්ගේ එකතුව රු.772,525 ක් ද, වර්ෂ 10 කටත් වැඩි කාලයක සිට අක්‍රීයව පවතින අරමුදල් ගිණුම් 02 ක අවසාන බැර ශේෂයන්ගේ එකතුව වූ රු.1,940,487 ක්ද ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඈ) ශිෂ්‍යත්ව අරමුදල් 14 ක් මගින් ගෙවා තිබුණු එකතුව රු. 219,186 ක් ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම්වලට හරකිරීම වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩා තොගයෙහි වටිනාකම රු.19,970,817 ක් වූ අතර උපලේඛන අනුව එම ශේෂය රු.19,334,611 ක් වූයෙන් රු.636,206 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට අනුව නොනිම් වැඩ වටිනාකම රු.251,323,236 ක් වුවද මූලධන කටයුතු සේවා අංශයේ තොරතුරු වලට අනුව එම වටිනාකම රු.235,915,252 ක් වූයෙන් රු.15,407,984 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

-------------------------------------

වටිනාකම හඳුනාගත නොහැකි විදුලි උත්පාදන යන්ත්‍ර 07 ක් සම්බන්ධයෙන් වත්කම් ලේඛන, නඩත්තු ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ 11 දෙනෙකුගෙන් අයනොවී පැවති ආපදා ණය ශේෂය රු.889,347 ක්වූ අතර එයින් වසර 10 කට වැඩි ශේෂ එකතුව රු.45,630 ක්ද වසර 05 ත් වසර 10 ත් අතර ශේෂ එකතුව රු.145,775 ක්ද හා වසර 1 ත් වසර 5 ත් අතර ශේෂ එකතුව රු.209,666 ක්ද විය. එමෙන්ම වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කිරීමේදී ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.18.1 වගන්තියට අනුව ක්‍රියා නොකිරීම හේතුවෙන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.613,508 ක මුදලක් ඉහත ණය ශේෂ තුළ ඇතුළත්ව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) (i) අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් 31 දෙනෙකු 2016 දෙසැම්බර් 31 දින වන විට අදාළ ගිවිසුම් කඩකර තිබුණු අතර ඉන් දෙදෙනෙකු විසින් ගිවිසුම් කඩකර මාස 21 ක් හා මාස 24 ක කාලයක් ගතවී තිබුණද ඔවුන්ගෙන් අයකරගත යුතු වටිනාකම ගණනය කර නොතිබුණි. තවද රු.37,804,927 ක් අයවියයුතු ඉතිරි ආචාර්යවරුන් 29 දෙනා අතුරින් ආචාර්යවරු 5 දෙනෙකුගෙන් අයවියයුතු වූ එකතුව රු.8,933,162 ක් අයකර ගැනීම සඳහා පමණක් නඩු පවරා තිබූ අතර ඉතිරි 24 දෙනාගෙන් අයවිය යුතු රු.28,871,765 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) අධ්‍යයන නිවාඩු ලබා 1989 වර්ෂයේදී විදේශ ගත වූ ආචාර්යවරයෙකුගෙන් අයවිය යුතු රු.1,122,267 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩුවේ තීන්දුව අනුව, විශ්වවිද්‍යාලය විසින් දෙවැනි වරට ආචාර්යවරයාහට විදේශගත විමට අවසර දීමේදී නිසි පරිදි පරිපාලන ක්‍රමවේදය අනුගමනය කර නොමැතිවීම හේතුවෙන් ගාස්තුවට යටත්ව පැමිණිල්ල නිශ්ප්‍රභා කර තිබුණි. නඩු තීන්දුව අනුව, ගිවිසුම කඩවීම සම්බන්ධයෙන් රු.703,311 ක් හා වැය වී ඇති නඩු ගාස්තු රු.117,300 ක් ලෙස එකතුව රු. 820,611 ක් විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු බවට තීරණය කර තිබුණද මෙම වාර්තාවේ දින වනවිටත් එම මුදල් අයවී නොතිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව නිලධාරියෙකුගේ නොසැලකිල්ලක්, ප්‍රමාදයක්, වරදක් හේතුවෙන් රජයට සිදුවන පාඩුවක් සම්බන්ධයෙන් එම නිලධාරියා පුද්ගලිකව වගකිව යුතු වුවද වගකිව යුතු නිලධාරියා හඳුනාගෙන ඔහුගෙන් අදාළ මුදල අයකර ගැනීමට 2017 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(iii) ඉහත (i) හි සඳහන් ආචාර්යවරුන් අතුරින් ගිවිසුම් කඩකර තිබූ ආචාර්යවරුන් 10 දෙනෙකුගෙන් අයවියයුතු මුදල් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීම සඳහා, එකඟතාවය පළකර ලිපි ලබාදී තිබුණද ඊට අදාළ එකතුව රු.8,136,685 ක් වර්ෂ 01 සිට වර්ෂ 16 ක කාලයක් ගතවී තිබුණද 2017 ජුනි 30 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ සභාපතිගේ අංක 2004/සුස/1 හා 2004 ජනවාරි 26 දරන උපදේශක චක්‍රලේඛය | පුස්තකාල පොත් සම්බන්ධයෙන් 2013 වර්ෂයෙන් පසුව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) අදාල කාර්යය නිමකළ විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 06 කදී ලබාගෙන තිබුණු එකතුව රු.197,829 ක අත්තිකාරම් පියවීම සඳහා දින 13 සිට දින 33 දක්වා කාලයක් ගතවී තිබුණි. |

(ii) අදාළ කාර්ය සඳහා අපේක්ෂිත වියදම නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අවස්ථා 06 කදී නියමිත මුදල ඉක්මවා එකතුව රු. 206,704 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.229,602,809 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.220,259,676 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,343,133 කින් පිරිහී තිබුණි. ආදායම රු.449,233,561 කින් වැඩිවී තිබුණද වියදම රු.458,576,694 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව පිරිහී තිබූ අතර 2012 වර්ෂයේදී රු.64,407,671 ක් වූ ඌනතාවය 2016 වර්ෂයේදී රු. 229,602,809 ක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු විශ්වවිද්‍යාලයේ දායකත්වය හිතකර අගයක් ගෙන තිබුණු අතර 2012 වර්ෂයේ රු.665,988,174 ක් වූ එය සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,248,780,499 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

විශ්වවිද්‍යාලය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපැලක් ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම බාහිර හා අභ්‍යන්තර පාර්ශවකරුවන් 05 දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණවල නඩු පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

- උසස් අධ්‍යාපනයෙහි විශිෂ්ටතාවයේ මධ්‍යස්ථානයක් ලෙස අන්තර්ජාතික පිළිගැනීම මුදුන් පමුණුවා ගැනීම.
- ජාතික අදාළත්වය සහ අන්තර්ජාතික පිළිගැනීම සමග පර්යේෂණ, නවෝත්පාදන සහ නිර්මාණකත්වය තුළ විශිෂ්ටත්වය මුදුන් පමුණුවා ගැනීම.
- ජාතික අවශ්‍යතාවයට සහ කර්මාන්තයේ අභිමතාර්ථවලට ප්‍රතිචාර වශයෙන් අධ්‍යාපනය සපයන ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් වීම.
- එහි ක්‍රියාකාරකම් තුළ විශිෂ්ටත්වය මුදුන් පමුණුවා ගැනීමට බුද්ධිමය භෞතික සහ සමාජ පරිසරයක් නිර්මාණය කිරීම.
- මනාව උගත් ප්‍රජාවක් සහ දීප්තිමත් විශ්වවිද්‍යාලයක සහ වෙනස්වන සමාජයක අභියෝග වලට මුහුණ දීමට ලොල් වූ ආකල්ප ඇති නිපුණ සහ තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් සහ ශිෂ්‍යයන් බිහි කිරීම.

- උසස් තාක්ෂණය සහ වෙනත් විශේෂඥ සේවා පිළිබඳ ප්‍රමුඛ උපදේශකයා සහ සපයන්නා බවට පත්වීම.
- ශ්‍රී ලංකාවේ සියළු අදාළ ක්ෂේත්‍රයන් සහ උසස්/ වෘත්තීය අධ්‍යාපනය තුළ ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ ජාතික සංවර්ධනයේදී රජයේ උපදේශකයා වීම.
- තත්ව පාලනය සහ කාර්යක්ෂම සංස්ථාපිත පාලනයක් සඳහා යාන්ත්‍රණයක් ආයතනගත කිරීම .

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොදු යටිතල පහසුකම් සංවර්ධනය යටතේ අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සහ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් ඉඩම් දෙකක් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 1,700 ක් ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එම ඉඩම් අත්පත් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013/2014 අධ්‍යයන වර්ෂයේදී පාඨමාලා 7 ක ශිෂ්‍ය පුරප්පාඩු 52 ක්ද 2014/2015 අධ්‍යයන වර්ෂයේදී පාඨමාලා 8 ක පුරප්පාඩු 47 ක් ද සහ 2015/2016 අධ්‍යයන වර්ෂයේදී පාඨමාලා 8 ක පුරප්පාඩු 57 ක්ද පැවතුණි.

(ඇ) (i) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, අළුතින් පාඨමාලා ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක විෂය ක්ෂේත්‍රයන් 07 ක් වෙනුවෙන් රු.මිලියන 155 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඉංජිනේරු පීඨයේ නව අභ්‍යන්තර පාඨමාලා හා විෂයයන් 02 ක් පමණක් හඳුන්වා දී තිබුණු අතර අනෙක් පීඨයන්හි කිසිදු අභ්‍යන්තර පාඨමාලාවන් හා විෂයයන් හඳුන්වා දීමක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

(ii) ඉංජිනේරු පීඨය, වාස්තු විද්‍යා පීඨය,තොරතුරු තාක්ෂණ පීඨය හා උපාධි අධ්‍යයන පීඨය යන පීඨ 04 හි පිළිවෙලින් පශ්චාත් උපාධි පාඨමාලා 07 ක් ,04 ක් , 02 ක් හා එකක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ඉංජිනේරු පීඨයේ පමණක් එක් පශ්චාත් උපාධි පාඨමාලාවක් ආරම්භ කර තිබුණි.

(ඈ) ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළ සිසුන්ට දැනුම ගවේෂණයට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමේ අභිලාෂයෙන් 2016 ක්‍රියාකාරී සැලැස්මට අනුව පුස්තකාල ඉඩකඩ වැඩිකිරීම, පුස්තකාල පොත් මිලදී ගැනීම සහ විද්‍යුත් ඉගෙනුම් පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් එකතුව රු.මිලියන 42 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර දරන ලද සත්‍ය වියදම රු. මිලියන 9.25 ක් විය. තවද, අනෙකුත් පුස්තකාල සමග ජාලගත සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමේ කාර්ය සඳහා රු.මිලියන 05 ක් ඇස්තමේන්තු කර තිබුණද අදාළ කාර්යය ඉටුකර නොතිබීම හේතුවෙන් පුස්තකාල පහසුකම් ඉහළ නැංවීම සඳහා දරා තිබුණු දායකත්වය පහළ මට්ටමක පැවතුණ බව නිරීක්ෂණය විය.

(ඉ) පර්යේෂණ සිදුකිරීම තුළින් නවෝත්පාදන හා නිර්මාණශීලීත්වය ඉහළ නැංවීම සඳහා 2016 වර්ෂය ආරම්භයේ ක්‍රියාත්මක තත්ත්වයේ පර්යේෂණ 92 ක් අතුරින් රු.12,001,110 ක ප්‍රතිපාදන ලබාදී තිබූ පර්යේෂණ 16 ක් අවසන් කර තිබුණද වාර්තා ඉදිරිපත් කළයුතු කාලසීමාව සමාලෝචිත වර්ෂය අවසානයට ඉක්මවා ගොස් තිබුණි. තවද 2016 වර්ෂයේදී පර්යේෂණ 63 ක් අළුතින් ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී වෙන් කර තිබූ රු.මිලියන 45 ක ප්‍රතිපාදනයෙන් සියයට 77 ක් හෙවත් රු. 34,709,255ක් ඒ සඳහා වැයකර තිබුණි.

(ඊ) පර්යේෂණ ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම මත අවලංගු කිරීම හෝ ඉල්ලා අස්කර ගැනීම සිදුකර තිබුණු අවස්ථා 03 ක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා වසර 03 ත් වසර 05 ත් අතර කාලයක් ගතකර තිබීම හේතුවෙන් එම පර්යේෂණ සිදුකිරීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පුස්තකාලයෙන් ලබා ගන්නා පොත් නියමිත කාලසීමාව තුළ නැවත භාර නොදීම මත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයෙන් දඩ මුදල් අයකර නොතිබුණ අතර පොත් ආපසු භාර නොදුන් කාර්ය මණ්ඩලය වෙත නැවතත් පොත් ලබාදුන් අවස්ථා නිරීක්ෂණය විය.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති එකතුව රු.5,259,288 ක් වූ අරමුදල් 36 කින් පසුගිය වර්ෂ 05 තුළ කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීමට කටයුතු කර නොතිබුණි. තවද, ශිෂ්‍යත්ව අරමුදල් මගින් සිසුන්ට සාධාරණ පදනමක් මත ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අවශ්‍ය නිර්ණායක ඇතුළත් කරමින් නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් 26 ක් අතුරින් අරමුදල් 17 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ප්‍රතිපාදනයක් ලැබී නොතිබුණු අතර අරමුදල් 09 ක් වෙනුවෙන් එකතුව රු.8,642,678 ක් ලැබී තිබුණි. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.14,359,476 ක් වූ අතර එම අරමුදල් කිසිදු දෙපාර්තමේන්තු සංවර්ධන ක්‍රියාවලියක් වෙනුවෙන් යොදාගෙන නොතිබුණි.

(ඇ) කාර්ය මණ්ඩල සහ සිසුන්ගේ ක්‍රියාකාරකම්, විද්‍යාගාර හා දෙපාර්තමේන්තු උපකරණ සහ දෙපාර්තමේන්තු වැඩ යටතේ වියදම් දැරීමේ අරමුණින් පවත්වාගෙන යන පාඨමාලා සංවර්ධන අරමුදල් 18 ක ආරම්භක ශේෂ එකතුව රු. 5,056,707 ක් වූ අතර ඉන් අරමුදල් 08 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,605,399 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.6,662,106 ක් පැවතුණු අතර සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලේ කිසිදු පාඨමාලා සංවර්ධන කාර්යයක් වෙනුවෙන් වැයකර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නඩත්තු අංශය යටතේ ක්‍රියාත්මක තත්ත්වයේ ඇති ප්‍රධාන විදුලි උත්පාදන යන්ත්‍ර 07 න් 04 ක නියැදි පරික්ෂාවට අනුව යම් මාසයක උපරිම වශයෙන් විදුලිය පරිභෝජනය කල දිනයේදී වැයවූ විදුලි ඒකක ප්‍රමාණය සැළකිල්ලට ගැනීමකින් තොරව කුඩා විදුලි ධාරිතාවයක් අවශ්‍ය ස්ථානයන්හි විශාල ධාරිතාවයකින් යුත් විදුලි උත්පාදන යන්ත්‍ර සවිකර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ල සඳහා සවිකර ඇති විදුලි උත්පාදන යන්ත්‍රයෙන් සියයට 62 ක විදුලි ධාරිතාවයක්ද නව නේවාසිකාගාරය වෙනුවෙන් සවිකර ඇති විදුලි උත්පාදන යන්ත්‍රයෙන් සියයට 83 ක විදුලි ධාරිතාවයක්ද වැඩ අංශයෙහි සවිකර ඇති විදුලි උත්පාදන යන්ත්‍රයෙන් සියයට 29 ධාරිතාවයක්ද අපතේ යාමක් සිදුවී තිබුණු අතර මෙම අපතේ යන ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) නඩත්තු අංශ ගබඩාවෙහි පැවති වට්නාකම රු. 274,387 ක් වූ තීන්ත ලීටර් 356 ක් සහ වටිනාකම සඳහන් නොවූ තීන්ත ලීටර් 110 ක් කල් ඉකුත් වී තිබුණි.

## 4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

නොනිමි වැඩ වටිනාකම තුළ ඇතුළත් රු.1,273,329 ක් වූ "යෝජිත බහුකාර්ය ශ්‍රවණාගාරය" (Proposed Multipurpose Auditorium) ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පිළිවෙලින් 68 දෙනෙකු හා 56 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුනු අතර එක් ගබඩා භාරකරුවකුගේ අතිරික්තයක් පැවතුනි.

## 4.7 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

--------------------------

නව ආපනශාලා සංකීර්ණය 2015 නොවැම්බර් 24 දින විවෘත කර තිබුණද ඊට අවශ්‍ය පුටු හා මේස රජයේ ප්‍රම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත් ආයතනයකින් කුලී පදනම මත ලබාගෙන තිබුණි. ඒ අනුව, 2016 මාර්තු 23 දක්වා මාස 04 ක කාලයක් සඳහා ප්ලාස්ටික් පුටුවක් රු.20 බැගින් පුටු 240 ක් හා ප්ලාස්ටික් මේසයක් රු.40 බැගින් මේස 50 ක් ලබාගැනීම වෙනුවෙන් පුද්ගලික සමාගමක් වෙත රු.745,920 ක් ගෙවා තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

## 5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-----------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 04 වගන්තිය ප්‍රකාරව, වර්ෂයට අදාළව යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය , අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය , ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන අංශය ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, විගණක සහකාරවරයෙකු, විගණන ලිපිකරුවන් තිදෙනෙකුගෙන් සහ පරිගණක යෙදවුම් සහකාර හා කම්කරු නිලධාරියෙකුගෙන් සමන්විත වී තිබුණි.මෙයින් ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක සහ විගණන සහකාර හැර විගණනය සම්බන්ධ වෘත්තිය නිපුණත්වයක් ඇති නිලධාරීන් අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්ත කර නොතිබුණි.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------------

2014 නොවැම්බර් 20 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කර තිබෙන යුනි කන්සල්ටන්සි සර්විසස් සමාගම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනිව පිහිටුවා තිබෙන බවත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල එකඟතාවය ලබාගත යුතු බවත් අවධාරණය කර තිබුණි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා එකඟ වී තිබුණ ද , 2017 මැයි 29 දින වනවිටත් එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. එසේ වුවද, විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ ගාස්තු වශයෙන් රු.3,640,142 ක් ද කළමනාකරණ තාක්ෂණවේදී ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාව (MBA in Management Technology) සඳහා රු.299,415 ක්ද ලෙස එකතුව රු.3,939,557 ක් යුනි කන්සල්ටන්සි සර්විසස් සමාගම වෙත ගෙවා තිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර සියයට 15 සිට 23 දක්වා පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කේත අංක යටතේ පවත්වා නොතිබීම.<br>(ii) ආයතනය සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය නොකිරීම. |
| (ආ) | අයවැය ලේඛනමය පාලනය | එක් එක් කාර්යයන් සඳහා නියමාකාරයෙන් සැලසුම් සහගතව අයවැය පුරෝකථන පිළියෙල නොකිරීම. |
| (ඇ) | අරමුදල් කළමනාකරණය | අරමුදල් ඇති කිරීමේ අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ඈ) | ගබඩා පාලනය | (i) භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානයේ භාණ්ඩ නිකුත් කිරීම දක්වා වූ සියළු වගකීම් ගබඩා භාරකරුට පවරා තිබීම.<br>(ii) ගබඩා පොත්පත් හා බින්කාඩ්පත් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබීම හා විධිමත් අධීක්ෂණයක් සිදු නොකිරීම.<br>(iii) ගබඩා භාරකරු වෙත ගබඩාවට අදාළ කාර්යයන් පමණක් පැවරිය යුතු වුවත් රාජකාරී ලැයිස්තුවට අනුව භාණ්ඩ මිලදී ගැනීමට අදාළ කාර්යයන්ද පවරා තිබීම. |
| (ඉ) | කාර්යමණ්ඩල පරිපාලනය | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුනොකිරීම. |
| (ඊ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම. |
| (උ) | පුස්තකාල පරිපාලනය | පුස්තකාල පොත් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන අනුගමනය නොකිරීම. |